
# කම්මැලි කූඹි පැංචා



මෙතුෂි උමාෂා රාජපක්ෂ

# කම්මැලි කුඹී පැංචා

ප්‍රථම එළි දැක්වීම :- 15/11/2023

ISBN- 978-624-206-791-9

මෙතුෂි උමාෂා රාජපක්ෂ

# පිදුම

'අ' යන්නේ සිට මා හට සිප් සතර
කියා දීමට වෙර දරණ
මාගේ දෙමව්පියන්ටත් පාසල් සෙවනේ
මා හට අකුරු කරන
මාගේ ආදරණීය ගුරු මෑණිවරුන්ටත්,
පියවරුන්ටත් මෙම
පොත ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකමත් එක කාලෙක පුංචි කැලෑ රොදක
කුඹි රැළක් ජීවත් වුණා .
මේ කුඹි රැළේ කම්මැළි කුඹි පැංචෙක්
හිටියා .


හැබැයි මේ  කුඹි රැළේ සිටිය කුඹි රැජින
නම් හරිම කඩිසරයි .

මේ කුඹි රැජින රැළේ  හැමෝටම කඩිසරව
වැඩ කරන්න සැමවිටම  කියලා දුන්නා .




එත් , කම්මැලි කුඹි පැංචා නම් ඒවාට කැමැති වුණේ නෑ .

මේ  අතරේ කුඹි රැජින හදිසියේම රැස්වීමක් සූදානම් කළා



හැමෝම එතනට රැස්වුණා ....

තව ටික දවසකින් මේ කැලයට
මහා වැස්සක් ඇද හැලෙන්නයි
යන්නේ ....කුඹි රැජින
පැවසුවා .



කුඹි රැළ කුසු කුසු ගාමින් කතා බහ කළා .
හැබැයි , කම්මැලියා නම් කතා බහක් නෑ .

කුඹි රැජින ;

"අපි එයට සුදානම් විය යුතුයි .

අපි එයට සුදානම් , හැමෝම හඬ නඟා

පැවසුවා . මං නම් එන් නෑ ...

කම්මැළි කුඹියා කීවා .


අපි කම්මැළි නෑ ...

"අපි යනවා කෑම රැස් කරන්න ."

හැමෝම යන්න ගියා .

"මම නම් එන්නේ නැහැ .."

කම්මැළි කූඹි පැංචා ගුලට රිංගා ගත්තා.



මේ සියල්ල සිදුවන ආකාරය කම්මැළි කුඹි පැංචා බලා හිටියා.

මහා වැස්ස වහින්න ගත්තා .........

එළියටවත් බහින්න බෑ ...

කම්මැළි කුඹි පැංචා ගුලෙන් එළිය බල බලා සිටියා.

අනෙක් කුඹියන් රැස් කරගත් කෑම කාලා
සතුටින් හිටියා .

කම්මැලි කුඹි පැංචා ගුල තුළම සිර වී
කුසගින්න වැඩි වී ලෙඩ වුණා .......

කුඹි රැජින වහ වහා කෑමත්
රැගෙන ගුල තුළට ආවා .......
ලෙඩ වූ කුඹි පැංචා ට ආහාර දී සනීප කළා .




බොහොම ස්තූතියි රජිනියනි .

මම කම්මැළි වූ නිසයි මේ සේරම වුණේ .

දැන් මට තේරෙනවා කම්මැළි වුණොත්
මොකද වෙන්නේ කියලා .





ආය නම් මම කම්මැලි වෙන්නේ නෑ .

අද ඉඳලම කඩිසරව වැඩ කරන්න මමත්
පටන් ගන්නවා .

කුඹි පැංචා කීවා .

එදා ඉඳලම කම්මැලි කුඹි පැංචා
කඩිසර වුණා.



## ආදර්ශය

**පුංචි ඔයාලටත් මම කියන්නේ කම්මැළි නොවී කඩිසරව වැඩ කරන්න කියලයි**

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට

යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක